**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2013**
-----------------------------------------------------------------

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 7(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

**1.4 මතය ව්‍යාචනය සඳහා පදනම**
-----------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේ දැයි තීරණය කිරීමට මට නොහැකි විය.

**2. මූල්‍ය ප්‍රකාශන**
-----------------

**2.1 මතය ව්‍යාචනය**
-------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත1

(i) ප්‍රමිතයේ 38 ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ තක්සේරුවක් කර නොතිබුණු අතර ප්‍රමිතයේ 132 (ඇ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන තේරුම් ගැනීමට අදාලවන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව්කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 108 ඡේදය ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණතෙහි හෝ සටහන් තුළ මුළු අයභාරයේ උපවර්ගීකරණයක් අදාළ අස්ථිත්වයේ මෙහෙයුම්වලට යෝග්‍ය පරිදි වර්ගීකරණයකර ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ලෙස ලැබී තිබුණු රු.18,705,085 ක ආදායම වර්ගීකරණයකර ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

ප්‍රමිතයේ 70 ඡේදයේ සඳහන් සාධක සැලකිල්ලට ගෙන වත්කමක ප්‍රයෝජනවත් ජීවිත කාලය නිශ්චය කළයුතු වුවත් ඒ පිළිබඳ අවධානය යොමු නොකර ගෘහ භාණ්ඩ හා සවිකිරීම්, කාර්යාල උපකරණ හා පරිගණක වලින් සමන්විත සියළුම ජංගම නොවන වත්කම් වාර්ෂිකව සියයට 5 බැගින් ක්ෂයකර තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෘජුවම බැංකුවට ලැබෙන ලියාපදිංචි ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම් ගත කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන ක්‍රියාත්මක කර නොතිබුණි. ඒ අනුව 2008 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී බැංකුවට සෘජුවම ලැබී තිබුණු රු.30,975,750 ක් වූ මුදල් හඳුනාගෙන ඒ ඒ වර්ෂවලදී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බව 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය මගින් හෙළිදරව් කර තිබුණි. තවද එම කාලපරිච්ඡේදය තුළදී සෘජුවම බැංකුවේ තැන්පත් කළ බවට ගනුදෙනුකරුවන් විසින් ආයතනයට ඉදිරිපත් කර තිබුණු කුවිතාන්සි පදනම් කර ගනිමින් රු.26,310,395 ක් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණු නමුත් එම මුදල් බැංකුවට ලැබී නොතිබුණු බව 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය මගින් හෙළිදරව් කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි ගාස්තු ආදායම් ලෙස හඳුනාගෙන තිබුණු රු.18,705,085 ක අදාළ බව, නිවැරදි බව, සම්පූර්ණ බව හා විස්වාසනීයත්වය පිළිබඳව සහතික විය නොහැකි වේ.

(ආ) ඉකුත් වර්ෂ දෙකේ දී සහ සමාලෝචිත වර්ෂය තුළදී කල්පිරුණු භාණ්ඩාගාර බිල්පත්වලින් සෘජුවම බැංකුවට ලැබී තිබුණු පොලී ආදායම රු.12,730,901 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) නියාමන සභාව නමින් පවත්වා තිබුණු ජංගම ගිණුමෙන් ඉකුත් වර්ෂ දෙකෙහි අවස්ථා 04 කදී රු.8,500,000 ක් හා සමාලෝචිත වර්ෂයේ එක් අවස්ථාවකදී රු.5,000,000 ක් නියාමන සභාව නමින් වූ ඉතිරිකිරීමේ ගිණුමට මාරු කර තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී එම ඉතිරිකිරීමේ ගිණුමෙන් රු.3,000,000 ක් නැවත ජංගම ගිණුමට මාරු කර තිබුණි. නමුත් එම ගනුදෙනුවල හර හා බැර සටහන් මුදල් පොතේ සටහන් කර නොතිබුණු අතර ගිණුම් තුලනය කිරීම සඳහා රු.10,500,000 ක් ජංගම වගකීමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඈ) 2013 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී භාණ්ඩාගාර බිල්පත් විකිණීමෙන් ලැබී තිබුණු රු.10,440,000 ක් හා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සඳහා වැයකර තිබුණු රු.10,225,270 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී බැංකුව විසින් අයකර තිබුණු බැංකු ගාස්තු රු.11,470 ක් හා බැංකු හර බදු රු.34,752 ක් ගිණුම්ගත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිළි නොකළ වෙනස්කම්

2013 දෙසැම්බර් 31 දිනින් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනයට ගලපා තිබුණු, මුදල් පොතට වඩා බැංකුවේ අඩුවෙන් දැක්වුනු රු.615,000 ක් වූ හඳුනානොගත් ශේෂය පිළිබඳව විස්තර කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. තවද මුදල් පොතේ ශේෂයත්, බැංකු සැසඳුම් ප්‍රකාශනයේ සඳහන් මුදල් පොතේ ශේෂයත් අතර රු.493,899 ක වෙනසක් විය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.10,000,000 ක් වූ භාණ්ඩාගාර බිල්පත්වල සහතික ඉදිරිපත් නොවූ අතර එම භාණ්ඩාගාර බිල්පත්වල අංක, තැන්පත් කළ දිනය, කල්පිරෙන දිනය හා වටිනාකම ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

## 2.3 ලැබිය යුතු ගිණුම්

2008 වර්ෂයේදී හා සමාලෝචිත වර්ෂයේදී තැන්පත් කර තිබුණු නමුත් අගරු වී තිබුණු චෙක්පත් 04 ක වටිනාකම රු.292,546 ක් අදාළ පාර්ශවයන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය | අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව සභාව විසින් 2013 දෙසැම්බර් 31 දින වන විට රු.14,085,716 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>--------------------------------------- | |
| | (i) මුදල් රෙගුලාසි 139 (6), 141(3)(ඇ) | චෙක්පතකින් ගෙවීම් කරන නිලධාරියා සහ චෙක්පත අත්සන් කරන නිලධාරීන් චෙක්පතේ සඳහන් වන නම හා වෙනත් විස්තර වවුචරයේ සඳහන් එකී විස්තර සමඟ සැසඳෙන බව තහවුරු කරගෙන ගෙවීම් කිරීමට හා චෙක්පත අත්සන් කිරීමට කටයුතු කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී මුදල් චෙක්පතක් මගින් රු.40,350 ක් ගෙවා තිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 384(2) | චෙක්පත්වල ආරක්ෂාව උදෙසා සෑම චෙක්පතක්ම රේඛනය කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී රේඛනය නොකළ චෙක්පත් 6 ක් මගින් රු.780,590 ක් ගෙවීම් කර තිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 388 හා 389 | සමාලෝචිත වර්ෂය තුළදී චෙක්පත් භාරදීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 395 | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කළ යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේ මාසික බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු අතර ඒ වෙනුවට 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සම්පූර්ණ වර්ෂය සඳහා එක් බැංකු සැසඳුම් ප්‍රකාශනයක් පිළියෙල කර ඉදිරිපත් කර තිබුණි. |
| | (v) මුදල් රෙගුලාසි 396 (ඇ) | ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්ම වූ රු.21,500 ක් වටිනා චෙක්පත් 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පිරිවැය රු.1,178,340 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පිරිවැය රු.2,225,140 ක් වූ පරිගණක හා මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ අතිරික්තය රු.3,851,004 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.394,446 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.4,245,450 කින් වර්ධනය වී තිබුණි. පළාත් සභා දායකවීම් රු.2,248,000 කින් වැඩිවුවද ලියාපදිංචි ගාස්තු ආදායම රු.6,784,085 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2009 වර්ෂයේ රු.1,437,716 ක්වූ අතිරික්තය උච්ඡාවචනයන් සහිතව 2013 වර්ෂයේදී රු.3,851,004 ක අතිරික්තයක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2009, 2010, 2011, 2012 හා 2013 වර්ෂවල සභාවේ දායකත්වය පිළිවෙලින් රු.2,871,214 ක්, රු.2,530,453 ක්, රු.2,721,073 ක්, රු.1,201,872 ක් හා රු.6,171,947 ක් වූයෙන් 2009 වර්ෂයේ සිට 2010 වර්ෂය වන විට දායකත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 12 කින් පිරිහීමක් සිදුවී තිබුණු අතර 2011 වර්ෂයේදී එය සියයට 7 කින් ඉහළ ගොස් තිබුණද 2012 වර්ෂයේදී එය නැවතත් සියයට 56 කින් පිරිහී තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය වන විට දායකත්වය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 413 කින් ඉහළ ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 සැලසුම් කිරීම

---

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5 වගන්තිය ප්‍රකාරව, ආයතනයේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03 කට නො අඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද නියාමන සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණු බැවින් සභාවේ කාර්යසාධනය පිළිබඳ අදහසක් ඉදිරිපත් කළ නොහැකි විය.

(ආ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනතේ 2(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතුය. නියාමන සභාව ආරම්භ කළ 2007 වර්ෂයේදී ලියාපදිංචි කර තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව 1,747 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම සංඛ්‍යාව 656 ක් දක්වා එනම් සියයට 62 කින් අඩුවී තිබුණි. එලෙස ලියාපදිංචිය අඩුවීමට හේතුව එම පෞද්ගලික වෛද්‍ය ආයතන වසා දැමීමද නැතහොත් ලියාපදිංචිය ලබා නොගෙනම ආයතන පවත්වාගෙන යාමද යන්න පිළිබඳව පරීක්ෂාවක් සිදුකර නොතිබුණු අතර ලියාපදිංචි වියයුතු පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 9 වගන්තියේ දැක්වෙන පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත්වී තිබුණි.

(i) ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වා ගෙන යායුතු ප්‍රමිති සංවර්ධනය කිරීම හා අධීක්ෂණය කිරීම.

(ii) සියළු පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීම.

(iii) පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පිරිනමනු ලබන හෝ සපයනු ලබන රෝගීන් රැකබලා ගැනීමේ සේවාවල ගුණාත්මකභාවය තහවුරු කිරීම.

(ඇ) පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව, සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාත්මක කළ යුතුවුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ පිළිබඳව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**4.3 කාර්ය මණ්ඩල පරිපාලනය**

-----------------------------

නියාමන සභාව ආරම්භ කළ වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ කාර්යයභාරය හා ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවාගැනීමට කටයුතු කර නොතිබුණු අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය නොමැතිව 2012 වර්ෂයේදී කළමනාකරණ සහායකයෙකු හා 2013 වර්ෂයේදී ගිණුම්කරණ සහායකයෙකු බඳවාගෙන තිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

--------------------------------------------

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 7(1) වගන්තිය ප්‍රකාරව, පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව 1971 අංක 38 දරන මුදල් පනත මෙම සභාව සඳහා වලංගු වන බැවින් එම පනතේ 13(1) වගන්තිය ප්‍රකාරව වාර්ෂික ගිණුම් පිළියෙල කර මුදල් වර්ෂය අවසන්වීමෙන් පසු මාස 04 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වර්ෂ හතරක ප්‍රමාදයක් සහිතව 2018 මැයි 28 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**5.2 අභ්‍යන්තර විගණනය**

-------------------------

සමාලෝචිත වර්ෂය තුළදී නියාමන සභාවේ ගනුදෙනු පිළිබඳව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**5.3 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) නියාමන සභාව විසින් නියාමන සභාවේ අළුතින් ලියාපදිංචි වන සියළු පෞද්ගලික වෛද්‍ය ආයතනවල ප්‍රදර්ශනය සඳහා අළුත් නාමපුවරුවක් ලබාදී තිබුණු අතර 2011 නොවැම්බර් 03 දිනෙන් පසුව 2013 ඔක්තෝබර් මස දෙවනවර ලංසු කැඳවා අවම ලංසුව ඉදිරිපත් කර තිබුණු පළමු කොන්ත්‍රාත්කරු වෙතම කොන්ත්‍රාත්තුව 2013 ඔක්තෝබර් 22 දින ප්‍රදානය කර එකක් රු.2,400 බැගින් කුඩා නාමපුවරු 160 ක්, එකක් රු.2,900 බැගින් මධ්‍යම නාමපුවරු 60 ක් හා එකක් රු.3,550 බැගින් විශාල නාමපුවරු 20 ක් වශයෙන් මුළු මුදල රු.629,000 ක් ගෙවා නාමපුවරු 240 ක් මිලදී ගෙන තිබුණි. ඒ පිළිබඳව පහත නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.4.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු මගින් සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතු වුවද, නියාමන සභාව විසින් මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු සහ තාක්ෂණික ඇගයීම් කමිටු පිහිටුවා නොතිබුණි. ඒ වෙනුවට නියාමන සභාවේ කළමනාකරණ කමිටු රැස්වීම්වලදී සහ මාසික සභා රැස්වීම්වලදී ගනු ලබන තීරණ මත පදනම්ව මෙම ප්‍රසම්පාදනයන් සිදුකර තිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.1.1 මාර්ගෝපදේශය ප්‍රකාරව, තාක්ෂණික පිරිවිතර හා සැලසුම් ආදිය ඇතුළු ලංසු කැඳවීමේ ලේඛන නියාමන සභාව විසින් පිළියෙල කර තිබුණු බව තහවුරු කර ගැනීමට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(iii) සැපයුම්කරුවන් 03 දෙනෙකු පමණක් ලංසු ඉදිරිපත්කර තිබුණද, සැපයුම්කරුවන් කීදෙනෙකු වෙත ලංසු ආරාධනා යැවුවේද, ලංසු ආරාධනා යැවුවේ කෙසේද, ලංසු ලැබුනේ කෙසේද යන්න තහවුරු කර ගැනීමට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි.

(iv) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 මාර්ගෝපදේශය ප්‍රකාරව, ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගතකර එයට ලංසු විවෘත කිරීමේ කමිටුවේ සාමාජිකයින් සියලු දෙනාම අත්සන් තැබිය යුතු වුවද, එවැනි ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(v) එක් අවස්ථාවකදී සැපයුම්කරුවන් තිදෙනෙකු බැගින් ලංසු ලියවිලි ඉදිරිපත්කර තිබුණු නමුත් සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කර තිබුණු ලංසු ලියවිලිවල ලිපිනයක් හෝ දුරකථන අංකයක් හෝ සඳහන් කර නොතිබුණි.

(ඇ) පෞද්ගලික වෛද්‍ය ආයතනවල වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කිරීමේදී ලියාපදිංචි නව වර්ෂය සඳහන් කරමින් පැරණි නාමපුවරුවට අළුතින් කොටසක් එකතු කරමින් නාමපුවරු නැවත සැකසීමට (Refill) නියාමන සභාව කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදී නාම පුවරු 253 ක් නැවත සැකසීම (Refill) සඳහා රු.244,820 ක් වැයකර තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වාර්ෂිකව ලියාපදිංචිය අළුත්කර තිබුණු පෞද්ගලික වෛද්‍ය ආයතනවල පැරණි නාමපුවරු නැවත සැකසීම (Refill) සඳහා අළුත් නාමපුවරු සැපයූ සැපයුම්කරු විසින්ම අවස්ථා 2 කදී පහත විස්තර සඳහන් පරිදි ලංසු ඉදිරිපත් කර තිබුණි.

| නාම පුවරු වර්ගය | 2012 ජුනි 07 දින ඉදිරිපත් කර තිබුණු ලංසුව | 2012 ජුනි 28 දින ඉදිරිපත් කර තිබුණු ලංසුව |
|---|---|---|
| | රු. | රු. |
| විශාල | 1250 | 1050 |
| මධ්‍යම | 990 | 900 |
| කුඩා | 850 | 820 |

නමුත් වෙනත් ආයතනවලින් මේ සඳහා ලංසු කැඳවූ බව හෝ ලංසු ඉදිරිපත් කර තිබුණු බව හෝ සනාථ කිරීමට ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ii) 2012 ජුනි 28 දින ඉදිරිපත් කර තිබුණු අවම ලංසුව යටතේ අවස්ථා 04 කදී පමණක් නාමපුවරු අලුත් කිරීම සිදුකර තිබුණු අතර අවස්ථා 02 කදී වැඩි ලංසුව යටතේ නාමපුවරු අලුත්කිරීම සිදුකර තිබුණි. ඒ අනුව එකක් රු.90 බැගින් මධ්‍යම නාමපුවරු 23 ක් සඳහා රු.2,070 ක්ද එකක් රු.200 බැගින් විශාල නාමපුවරු 22 ක් සඳහා රු.4,400 ක්ද වශයෙන් මුළු නාමපුවරු 45 ක් සඳහා රු.6,470 ක් වැඩිපුර ගෙවා තිබුණි.

### 5.4 අයවැය පාලනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තියේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

## 6 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර නියාමන සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩල පරිපාලනය | ආයතනය ආරම්භ කළ වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ කාර්යයභාරය හා ප්‍රමාණය හඳුනාගෙන එයට ගැලපෙන ආකාරයට කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීමට හා බඳවාගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | ගිණුම්කරණය | බැංකු සැසඳුම් පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම, ප්‍රමාදවී පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් නිවැරදිව පිළියෙල කර නොතිබීම හා මුදල් පොත පවත්වාගෙන යාමේ දුර්වලතා පැවතීම. |